## මල් උයන
රත්න ශ්‍රී විජේසිංහ

මල් උයන කීවාට
ඒ බිමේ
මල් නොවන
බොහෝ දේ තිබුණා

පිපුණු මල් සුළඟ හා
හාද වී නැටුවා
පෙම්වතුන්,
බිම නිදන
සිඟන්නන් පසු කරන්
හෙමි හෙමින් කොඳුරමින්
ලිය ගොමුව සෙව්වා

මල් උයන කීවාට
ඒ බිමේ
බිම වැටුණු පරමලුත් තිබුණා
ළපලු පත් සේ ම
බිම පතිත වුණු
වියලි පරඬැල් පත් ද තිබුණා

වසන්තය සේ ම
ඒ භූමියේ
ගිමත් සමය ද
සැඟව සිටියා

**රත්න ශ්‍රී විජේසිංහ**
**විසින් රචිත**
ගොඩගේ සම්මානයෙන් පිදුම් ලැබූ
වස්සානෙන් පසුව කෘතියෙනි.

## ඵල ඇති දා
කළ්‍යානි පුෂ්පලතා

**ගල්පර නැත්නම්...**
ගලා බසින් දොළ පහරක සුන්දර
බව ගතට දැනේවිද?...
**ගනදුර නැත්නම්...**
අහස් ගැබේ පෑයූ රන් තරුවක
අගය ලොකුවට දැනේවිද?...
**පලබර නැත්නම්...**
මී අඹ සෙවනක විහඟුන්ගේ ගී
නාදය ඇසේවිද?
**මුණිගුණ නොමදන්...**
මිසදුටුවෙකුගේ දෝතට පියුමක්
ලැබුමෙන් පලක් ලැබේවිද?...
**ධන බලයෙන් අඩු නැත්නම්...**
**ගතේ සවිය තව ඇත්නම්...**
එක් රොක් වී තමා වටේ සිටින
වුන්ගේ සෑබෑ තත්වෙ
හඳුනගන්නට හැක්කේ කාටද?.



## කුමුදු මලක්
ප්‍රේමවංශ දසනායක

සවස්යම පිටත් වන
දුම්රියක මැදිරියක
විඩාවෙන් නිදි කිරන
වයස්ගත දනන් මැද

තවත් සමකයකු සේ
සැඟව සුපුරුදු විලස
අරමුනින් තොර සිතින්
හිස් බැලුම් හෙලන විට

නෙත ගැටුනි එක වරම
අසුනකට ඉදිරි පස
නව යොවුන් යුවතියකි
මැකී ගිය සිහිනයකි

ප්‍රභාවත් නෙතු සඟල
සිනා පිරි මුව කමල
ගලා උතුරා හැලෙන
දඟකාර රංගනය

රැගෙන යයි මතක සිත
අතීතයෙ සොහොන වෙත
සිහින් කන්කෙඳිරියක්
ඇසෙයි හදවත කොනක

තැත් කලද නේක වර
නෙත ඉවත හරවන්න
නොදැනීම යලි යලිදු
ඇදේ නෙත ඒ වෙතම

මෙතෙක් සිටිදැහැණ බිඳ
ගමනාන්තය පැමිණ
වෙන්ව විසිරී ගියද
තම තමන් පුරුදු මඟ

තව බොහෝ කලකටම
හදවතට බර හොවන
කිසියමක් ඉතිරි විය
මගේ ඇතුලාන්තය

## හිමි නමට පිරිකරක්
ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං

| | |
|---|---|
| සාරිපුත්ත මුගලන් හිමි පෙරටු | කොට |
| මහ රහතුන් වගේ දිදුලන සඟ | නමට |
| ලුණු රස වත් නොබල අති උත්තම | ලෙසට |
| දන් පැන් පුදති අපෙ අය - සැදැහැති | කමට |
| | |
| හිතවත් අපේ මිතුරෙක් පහු ගිය | දක |
| මවුබිම මරණයක තතු පවසා | සෝක |
| බණ දෙසුමක් අසන්නට - හවසක | රැක |
| ඇරයුම් කලා අපටත් - මිතු දම | ඒක |
| | |
| හාමුදුරුවෝ කැන්ද මිතුරා | පැමිණේ |
| බණ අහ ගන්න බිම දිගටයි ඉඳ | ගැනුනේ |
| පැයකට තරම් දිග බණ දෙසුමකි | ඇසුනේ |
| 'චිලවළු සුප්'ය හිමි සඳ ඉල්ලා | තිබුනේ |
| | |
| බණ නිම වෙලා වළඳන කල ගිලන් | පස |
| දායක පිරිස හිටියා හිඳ එකත් | පස |
| පිරිකර අත ගසන විට සැදැහැතියො | රැස |
| 'ඩොලර්' දාපු කවරය මත ගැටුනි | ඇස |
| | |
| බණ දෙසු සාදු නැවතත් ඇරලන්න | බලන් |
| මගෙ හිතවතා පන්සල වෙත යන්න | ගිහින් |
| හිඳ සිටි තැනම පුද දුන් පිරිකරය | තියන් |
| 'මුදල් කවරෙ' අර ගෙන - හිමි පිටව | ගිහින් |
| | |
| ගිය අය අමතන්න දුර කතනය | සෙව්වා |
| පිරිකර අමතකව ගොස් ඇති බව | කිව්වා |
| හාමුදුරුවෝ අපගේ මිතුරා | ලව්වා |
| 'පිරිකර අවැසි නැහැ' කියලා ඇඟ | වෙව්වා |
| | |
| 'තන්හකබයෝ' ගාථාවෙන් බණ | දෙසතී |
| තන්හා දුරු කරන පිලිවෙල ගැන | කියතී |
| සැදැහැති පිරිස් රවටා මඩි තර | කරතී |
| 'මහ කකුළුවෝ' වගෙ - උන් හරහටම | යතී |
| | |
| බොරුවක් හෙම නොවේ මෙය සහතික | ඇත්ත |
| ඒකයි සැදැහැතියො කවුරුත් දත | යුත්ත |
| අපි රැවටුනොත් මේ පවතින බොරු | මත්ත |
| නිරයක උපත මිස නැහැ සුගතිය | පැත්ත |
| | |
| 'උපසම්පදා සිල්' ගැන සඟවති | රහස |
| 'දස සිල්' වත් රකින අය නැහැ අද | දවස |
| මුදලට - වස්තුවට - බලයට ඇති | පවස |
| නැහැ නිම වෙලා - ලැබුවත් සිවුරක | |
| පහස | |
| | |
| පිරිකර සමග දන් පැන් පුද දෙන | ගානේ |
| කාටද ඒ - කියා දැන ගන්නට | ඕනේ |
| වංචා නිසා - තක්කඩි සාදුල | රැනේ |
| යහපත් හිමිවරුන් අසරණ වෙන | වානේ |
| | |
| තන්හා දුරු නොකර - කෙටි වෙන්නට | සසර |
| සම්බුදු වදන් මොඩිෆයි කරමින් | නිතර |
| ලෞකික චරිත රඟපානා අය | අතර |
| සිල්වත් හිමිවරුන් දැක ගත හැක | මිතුර |

## දිනිඳු ලෙසින්
කළ්‍යානි පුෂ්පලතා

| | |
|---|---|
| කලල් පිරි බොර දියෙහි පිපිණාත් තඹරු | තඹරුමය |
| නිල් දිය පිරි පොකුණක පිපුණාත් රුව | එලෙසමය |
| මෙදෙකින් කොතැන උපනත් සුවදත් පැහැයත් | එකසේය |
| එහෙනම් කිම? එමල පිපි ගැබ සෙවුමෙහි | ඵලය |
| නිලන තුරු මතට රැස් දහරා ගෙන | එන්න |
| ගලන දිය දහරා රන් පැහැ ගන් | වන්න |
| මහමැදුරත් පැල්පතත් එක සේ | බබලන්න |
| හැකිනම් හිරුට දිරි ගමු ඒ හා | සමවන්න |



